
# අසනි

සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

2024 මාර්තු-අප්‍රේල්
53 වන කලාපය.
රු. 50/=

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදි

ධනපති පංතියට
විකල්පය ලෙස
වාමාංශික පෙරමුණ
ගොඩනගමු..!

# රනිල්-පොහොට්ටු පාලනය කම්මුතුයි..!

**ජනතා අනුමැතියක් නොමැති බලයට පැමිණි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සමඟ පොහොට්ටු පාලනය කම්මුතු කර දැමීමට ජනතාව සූදානම් වී සිටිති. පසුගිය පළාත් පාලන මැතිවරණය කල් දමා ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස බලය පවත්වාගෙන යාමට රනිල් වික්‍රමසිංහ පාලකයා කටයුතු කළේ එවන් ජනතාවරමක නිසා ඔහුට ඉවත්ව යාමට පරිසරය නිර්මාණය වන නිසාය. එම මැතිවරණය පැවැත්වීමට මුදල් වෙන්කර තිබියදීත් එය කල්දැමීමට ක්‍රියා කළේ මැතිවරණය තුළින් ඇතිවන ජනතා විරෝධය යටපත් කිරීම සඳහාය.**



මේ වන විට ජනාධිපතිවරණය ද කල් දැමීමට කුරුමානවම් අල්ලමින් සිටින බවට කුකුසක් මතු වී තිබේ. රනිල් වික්‍රමසිංහ පිළිබඳ ජනතාවට කිසිදු විශ්වාසයක් නොමැත. ඔහුට අවශ්‍ය වන්නේ බලහත්කාරයෙන් මර්දනය යොදා ගනිමින් බලය කෙසේ හෝ පවත්වාගෙන යාමට කටයුතු කිරීමය. කිසිඳු සාමකාමී උද්ඝෝෂණයකට ඔහු ඉඩ නොදෙන්නේ ඒ නිසාය. ඕනෑම කුඩා උද්ඝෝෂණයක් දැවැන්ත ජනතා නැගී සිටීමක් විය හැකි බව ඔහු දැන සිටී. පසුගිය අරගලයේ අත්දැකීම් වලින් ඔහු පාඩම් ඉගෙන ගෙන ඇති නිසා එවන් තත්වයක් ආරම්බයේදීම මුලිනුපුටා දැමීම ඔහුගේ එකම පරමාර්ථය වී තිබේ.

එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමට අපාදුක් විඳින පීඩිත ජනතාව පිළිබඳ මේ පාලකයාට වගේ වගක් නැත. සතිපතා විදේශ සංචාරවලට රුපියල් කොටිගණන් මුදල් වැය කරමින් සිටිති. ඔහුගේ එකම අරමුණ රටේ සියලු සම්පත් ගෝලිය බලවතුන්ට විකුණා දැමීමය. ජාත්‍යාන්තර අරමුදල මත අර්බුදයට විසඳුම් ලබා දීමට හැකි බව ඔහු නිරන්තරව ජප කරමින් සිටී. මේ නිසාම මුළු රටම මහා ණය කන්දකට හිරකර දමා තිබේ. මේ වන විට විදේශ ණය හා දේශීය ණය රුපියල් ට්‍රිලියන 17 ක් බව වාර්තාවේ. මේ අතර තව තවත් ණය ගනිමින් ඔහු ජනතාව අතර බලාපොරොත්තු තබා බලයේ රැඳී සිටීමට ගන්නා උත්සහයට පැවැත්මක් නොමැත. මර්දනය ඔහුගේ පැවැත්මේ එකම අවිය බවට පත්කර ගෙන තිබේ. එය තවදුරටත් පවත්වාගෙන යන්නේ නම් දැවැන්ත විනාශයකට රට ඇඳ දමනු ඇත. ඒ සඳහා ඔහුට ණය ලබා දෙන ගෝලීය ධනපති බලවතුන්ගේ අනු මැතිය නොලැබේ. එවන් තත්ත්වයක් තුළ අර්බුදය තවත් තීව්‍ර වනු ඇත.

මෙවන් පසුබිමක් තුළ රනිල්ට අකමැත්තෙන් හෝ මැතිවරණය පැවැත්වීමට සිදු වේ. මැතිවරණයේදී ඇති වන ජනතා උද්යෝගය අන් කවරදාකටත් වඩා වැඩි වනු ඇත. පසුගිය අරගල යෙන් මතු වු ජන විරෝධය කියා පැවේ මේ කෲර පාලකයින් වහාම එළවා දැමිය යුතු බවය. මෙවර මැතිවරණයේ දී එම අවස්ථාව ජනතාවට ලැබෙනු ඇත. එමගින් රනිල් පොහොට්ටු පාලනය කම්මුතු කර දැමීම ජනතාවට සූදානම්ව සිටින බව පෙනේ. ■

## මාර්ගස්ථ පනත හකුලා ගනිව්..!



ජනතාව සතු මූලික අයිතියක් වන, ප්‍රකාශනයේ නිදහසට තිබෙන මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මර්දනය කිරීම සඳහා වත්මන් පාලකයින් ගෙන ඒමට තීන්දු කර තිබෙන මාර්ගස්ථ පනත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ව්‍යවස්ථාවට පටහැනි බව ප්‍රකාශ කර තිබේ. එකී පනත කඩි මුඩියේ ගෙන ඒමට පාලකයින් කටයුතු කළේ ඉදිරි මැතිවරණයේදී ඔවුනට එල්ල වන විවේචන යටපත් කිරීම සඳහාය. අධිකරණය විසින් ලබාදුන් තීන්දුව පාලකයින්ගේ අධිපතිවාදී තීන්දුව පරාජය කිරීමකි. මෙම පනත පරාජය කිරීමට රටපුරා ඇතිවූ උද්ඝෝෂන වලට නව ජයග්‍රහණයක් අධිකරණ තීන්දු විසින් ලබා දී ඇත.

එවන් පනතක් ගෙන ඒමට සාදාචාරාත්මක අයිතියක් පාලකයිනට නොමැත. මෙම පනත නැවත ගෙන ඒමට දරණ උත්සාහය කෙළවර වන්නේ ඉදිරි මැතිවරණයේදී රනිල් පොහොට්ටු ආණ්ඩුව කපොති වීමත් සමඟය. ■

## මහජන මුදල් නාස්ති කරන
## රනිල් උන්මාදය..

2024 නිදහස් දින සැමරුම රුපියල් ලක්ෂ 2500 ක් වැය කරමින් තම ප්‍රතිරූපය ගොඩනගා ගැනීමට කටයුතු කළ රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සතිපතා විදේශ සංචාර සඳහා රුපියල් කෝටි ගණන් වැය කරමින් සිටී. රට බංකොළොත් වී ඇතැයි ඔහු එක් වරක කියන අතර, එලෙස මහජන මුදල් නාස්ති කරන රනිල් පිළිවෙත කුමක් ද යන්න ජනතාව ප්‍රශ්ණ කරමින් තිබේ. සමස්ත ජන ජීවිතය තීව්‍ර අර්බුදයකට ඇද දමා ඇති මොහොතක රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මෙලෙස පාලකයින්ට ඉදිරි මැතිවරණයේදී ජනතාව නිසි පාඩම් ලබාදීමට කටයුතු කරනු ඇත. ■

# ජාතික ජන බලවේගයේ ඉරණම තීන්දු වන මැතිවරණයක්..!



ඉදිරියේදී පැවැත්වීමට තිබෙන මැතිවරණයේදී සම්ප්‍රදායික ධනපති කඳවු  රු දෙකට එරෙහිව නිර්ප්‍රභූ බලවේගයක් ලෙස ජාජබය වටා එකතුවන සමාජ බලවේග වැඩිවෙමින් තිබේ. 1950 ගණන්වල මැද භාගයේ සිට පැවැත්වූ සෑම මැතිවරණයවලදී එජාපය හා ශ්‍රිලනිපය මුල් කර ගත් හවුල් ආණ්ඩු බලයට පත් වූ අතර එය දෙකොන් සටනක් බව

> වත්මන් දේශපාලන වර්ධනයන් තුළ සමාජයේ වැඩි දෙනාගේ අවධානය යොමු වී තිබෙන්නේ ජවිපෙ හා ජාතික ජනබලවේගය දෙසට බව පෙනේ. මතුපිටින් එම බලවේගය තුළ දේශපාලන සුජාතා භාවයක් දකින්ට හැකි වූවත් ඔවුන්ද ඉතිහාසයේ වරින් වර ධනපති පක්ෂ බලයට පත් කිරීමේ කොටස් කරුවන් වී ඇත. එවන් පසුබිමක් තුළ ඔවුන්ට ආණ්ඩුවක් ගොඩනැගීමට හැකි වූවත් එය දිගට පවත්වාගෙන යාම පහසු නොවේ.

දගින් දිගටම දකින්නට හැකි විය. මෙවර එම තත්ත්වය වෙනත් මඟක් ගන්නා බව දකින්නට ලැබේ. එම සටන මෙවර තුන් කොන් සටනක් බවට පත්වි තිබේ. එම තුන් කොන් සටනේ  තවත් විශේෂයක් වන්නේ මෙම බල කඳවුරු තුන ගොඩනැගී තිබෙන්නේ ලාංකීය දේශපාලනයේ නව වෙනත් මුහුණුවරක් ලෙසය. මේ වන විට සමාජයේ බහුතර ජනතාව එජාපය ශ්‍රිනිපය සහ පොදු පෙරමුණ යන සම්ප්‍රදායික  පක්ෂ තුනම ප්‍රතික්ෂේප කිරීමේ තත්ත්වයකට පත් වී තිබේ. 2024 පැවැත්වීමට තිබෙන මැතිවරණයේදී මෙම තත්ත්වය වෙනස් වනු ඇත. මේ නිසාම පසුගිය ඉතිහාසය පුරා පැවැත්වූ මැතිවරණවලට වඩා මෙවර මැතිවරණය වෙනස් ආකාරයක් ගනු ඇත. එම තත්වය තුළ ආණ්ඩු වෙනසකට වඩා ඇතට දිවගිය සමාජ වෙනස් වීම් වලට මඟපාදන බව පෙනේ. මෙයට හේතු වන්නේ  සිටින ධනපති බලවේගවල බලතුලනය නව ආකාරයක හැඩරුවක් ගැනීමය. එය කම්කරු, ගොවි, දුගී, පීඩිත පන්තීන් හා මධ්‍යම පන්තික යන නිර්ප්‍රභූ  සමාජ පන්ති ස්ථරවල ආර්ථික සමාජ හා දේශපාලන අපේක්ෂා නියෝජනය කරන්නක් වනු ඇත. එම සමාජ ස්ථර අතර ගොඩ නැගෙන සන්ධානයන් හේතුකොට ගෙන වෙනස් දේශපාලන කඳවුරකට බලය මාරු විමට බොහෝ ඉඩ කඩ තිබේ.

වත්මන් දේශපාලන වර්ධනයන් තුළ සමාජයේ වැඩි දෙනාගේ අවධානය යොමු වී තිබෙන්නේ ජවිපෙ හා ජාතික ජනබලවේගය දෙසට බව පෙනේ. මතුපිටින් එම බලවේගය තුළ දේශපාලන සුජාතා භාවයක් දකින්ට හැකි වූවත් ඔවුන්ද ඉතිහාසයේ වරින් වර ධනපති පක්ෂ බලයට පත් කිරීමේ කොටස් කරුවන් වී ඇත. එවන් පසුබිමක් තුළ ඔවුන්ට ආණ්ඩුවක් ගොඩනැගීමට හැකි වූවත් එය දිගට පවත්වාගෙන යාම පහසු නොවේ. මෙම වෙනස්වීම් ගැඹුරින් තේරුම් ගනිමින්  ජනතාව මුහුණ දෙන ගැඹුරු සමාජ ආර්ථික ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමට ජාජබයට හැකිද යන්න බරපතල ප්‍රශ්නයකි. සමාජය ඉල්ලා සිටින්නේ රෙජීම් ජේන් එකක් වූවත් එවැන්නක් ලබා දීමට හැකිද යන්න සංවාදයට බඳුන් වෙමින් තිබේ. 2019 ජාජබය ඉදිරිපත් කළ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ අලුතින් වර්ධනය කරන බව ප්‍රකාශ කර තිබුනත් මෙය ලියන මොහොත දක්වා එය ඉදිරිපත් කර නැත. ධනේශ්වර නව ලිබරල් ආර්ථිකය මේ වන විට ඕජස් ගලමින් කුණු වෙමින් තිබෙන මොහොතක එයට නව අරුතක් එකතු කිරීම මඟින් අර්බුධයට විසඳුම් ලබා දිය නොහැකි වනු ඇත.

වසර 75 ක ඉතිහාසය තුළ ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ මූලික ගැටළුවලටවත් මෙම පසුගාමීව ධනපති පාලකයින්ට විසඳුම් ලබා දිමට නොහැකි වී ඇති නිසා එම ධනපති ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ මූලික ගැටළුව ලෙස පවතින,

1. කෘෂි කර්මාන්තයේ ගැටළුව
2. අධිරාජ්‍යවාදී මූල්‍ය ආයතනවල බලපෑම් වලින් මිදීම
3. ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සහ
4. ජාතික ප්‍රශ්න විසඳීම

වැනි මේ මූලික ගැටළුවලටවත් විසඳුම් ඉදිරිපත් කරන්නට පාලකයින්ට නොහැකි වි ඇත. අවම වශයෙන් මෙම නොවිසිඳුනු ප්‍රශ්නවලට විසඳුම් ලබා දීමට ජාජබයට ද හැකි වේද යන්න ගැඹුරින් සලකා බැලිය යුතුවේ.

පසුගිය ඉතිහාසයේ අත්දැකීම් දෙස ආපසු හැරී බලන්නේ නම් 1956 හා 1970 මැතිවරණවලින් සිදු වූයේ හුදු ආණ්ඩු වෙනසකට වඩා ඉක්ම ගිය රෙජීම් චේන්ජ් දෙකකි. ඒ අවස්ථා දෙකේදිම ආණ්ඩු බලය ලබා ගත්තේ බලයේ සිටි වෙනත් සමාජ පන්ති සංධානයන්ය. එමගින් ආර්ථික සමාජ දේශපාලන පරිවර්ථනයේ වෙනස්කම් දක්නට ලැබූ අතර එය වෙනත් රෙජීමයක් බවට පත් විණ.

2024 වර්ෂයේදී පැවැත්වීමට තිබෙන මැතිවරණය පිළිබඳව නිෂ්චිතතීරණයක් තවමත් නොමැති වී ඇත්තේ රනිල්ට වික්‍රමසිංහට මැතිවරණ ඇලජික් වී ඇති නිසාය. ඕනෑම මැතිවරණයක් තුළ ඔවුනට ලැබෙන අන්ත පරාජය ඔවුන් මේ වන විට තේරුම් ගනිමින් සිටිති.

මෙවන් සංකීර්ණ සමාජ පසුබිමක් තුළ 2024 පැවැත්වෙන මැතිවරණය පීඩිත සමාජ බලවේග ද්‍රවගත වීමක් වේ. එය වඩාත් හොඳින් පෙනෙන්නේ මැතිවරණයට නාම යෝජනා භාර දීමෙන් පසුවයි. මෙයට හේතුවන්නේ ලාංකේය සමාජ ඉතිහාසයේ දරුණුතම අර්බුදයට රට මුහුණ දී සිටින බැවිනි. එය විසඳීමට දැනට බලයේ සිටින කිසිදු පක්ෂයකට නොහැකි වී ඇත. මේ අර්බුදයේ මුළු බර කම්කරු, පීඩිත, දුගී සමාජ ස්ථරවලට හා මධ්‍යම පන්තිය මත පැවරී ඇත. මේ ව්‍යවසනය නිමක් නොපෙනෙන තත්වයකට ඇද දමා තිබේ. එය අවම කළ යුතුව තිබේ. ඒ සඳහා නව ආකාරයේ ආර්ථික සංවර්ධන ඉදිරි දැක්මක්ද, දේශපාලන නායකත්වයක්ද අවශ්‍ය වේ. එම අලුත් දේශපාලන නායකත්වය එජාපය ශ්‍රිලනිපය පොදු ජන පෙරමුණ මෙන්ම සමගි ජනබලවේගයද වැනි පාලක පන්තියේ දේශපාලන නියෝජිතයන්ට නොමැත මේ සඳහා නව ඉදිරි දැක්මක්ද දේශපාලන නායකත්වයක්ද ජවිපෙ / ජාජබයට ඉදිරිපත් කරන්ට නොහැකි වි ඇත. මේ ඇතිවී තිබෙන දේශපාලන බලතුලනය මගින් අත්දැකීම් ඇති ජනතාව අපේක්ෂා කරන්නනේ ගැඹුරු සමාජ පරිවර්ථකයකි.

මෙවන් තත්වයක් තුළ 2024 මැතිවරණය මීට පෙර පැවති මැතිවරණවලට වඩා අතිශය උණුසුම් මුහුණුවරක් ගනු ඇත. එයට හේතුව වන්නේ ධනපති පක්ෂ පිළිබඳව ජනතාව අතර විශ්වාසය දිගින් දිගටම බිද වැටී ඇති නිසාය. පසුගිය රාජපක්ෂ පාලනය බලයට පත් වී වසර දෙකක් යන විට දැවැන්ත ජනතා විරෝධයක් මතු වූයේ මෙම තත්ත්වය නිසාය. ඉදිරියේද ජනතා අපේක්ෂා බලාපොරොත්තුවලට විසඳුම් නොලැබේ නම් දැවැන්ත විරෝධයන් ඇති වීම වැළැක්විය නොහැක. එය ලංකේය සමාජයේ උඩු යටිකුරු කරන්නක් වනු ඇත. එය පන්ති අරගලයක් දක්වා දිව යන්නට පුලුවන. මේ නිසාම ඉදිරි මැතිවරණය ජාජබයේ අනාගත ඉරණම තීන්දු කරන්නක් වනු ඇත. පස මිතුරු සමාජ කඳවුරු දෙක අතරද මුහුණ දීමට සිදුවන අරගලයකට මඟ විවෘත කරනු ඇත. මෙය ලාංකේය සමාජයේ සුවිශේෂ තත්වයක් නිර්මණය කරනු ලබන්නකි. මේ නිසාම 2024 දේශපාලන බලපෙරළිය ධනපති ප්‍රජාතන්ත්‍රවාදය ස්වරූපයන් සඳහා නව මාවතක් විවෘත කරනු ඇත. ■

මනෝෂ් දේවප්‍රිය

# ජාතික ජන බලවේගයේ විදේශ ප්‍රතිපත්තිය කුමක්ද?



පසුගිය දශක කිහිපය පුරාම ජවිපෙ විවිධ බහුජන සංවිධාන ස්වරූපයන් ගොඩනගා ගනිමින් සමාජ බලවේග ඒකරාශි කර ගැනීමේ උපායන් අනුගමනය කළේය. ඔවුන් දේශපාලන උපතේ සිට දේශප්‍රේමය ආත්මය කරගත් ව්‍යාපාරයක් බවට පත් වී තිබුණි. ඔවුන් ආමන්ත්‍රණය කළේ දේශප්‍රේමී ජනතාවටය. 1988 දශකයේ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ලෙස කටයුතු කරමින් අනුගමය කරනු ලැබූ දේශපාලන විධික්‍රමය ප්‍රතිවිප්ලවකාරී හැඩරුවක් ගනු ලැබුවේය. වෘත්තීය සමිති නියකයින් ඇතුලු සාම්ප්‍රදායික පක්ෂවල ක්‍රියාදරයන්ට මරණ වරෙන්තුව ලබා දෙන බව ප්‍රකාශයට පත් කළේය. පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වන්නන් ජාතිද්‍රෝහීන් ලෙස ප්‍රකාශ කරමින් ඔවුන් ඝාතනය කිරීමට කටයුතු කළේය.

> ..ධනේශ්වර නොවන සංවර්ධන මාවතක් පිළිබඳ 1970 දශකයේ ල.ස.ස.ප, කො.ප යන පක්ෂ පෙනී සිටියේ එම යුගයේ නැගෙනහිර යුරෝපීය රටවල් වල එවැනි රාජ්‍යයන් ගොඩනැගී තිබූ නිසාවෙනි. ඒ වන විට ඔවුන් ඉදිරිපත් කළ තර්කවල යම් දේශපාලන පදනමක් තිබුනි. එත් වත්මන් ජා.ජ බලවේගයේ නායකයින්ට එවැනි කිසිදු දේශපාලන දැක්මක් නොමැති බව පෙනේ. ජාවිපෙ ඉතිහාසයට ඉන්දියානු විරෝධි වූවක්ය.

වත්මන් ජාතික ජනබලවේගය මැතිවරණවලට ඉදිරිපත් වීම සඳහා ගොඩනැගූ සංවිධානයක් බව දකින්නට හැක. මෙමගින් පොදු සංවිධාන රූපයක් වටා ජනතාව පෙළ ගස්වා ගැනිම ජවිපෙ දේශපාලන උපායක් බවට පත්ව තිබේ. ජවිපෙට එකවර බඳවා ගැනිමට නොහැකි පිරිස් ඒකරාශි කර ගැනීම මෙහි අරමුණ වේ. ජාතික ජනබලවේගය යන නම උපායිකව පාවිච්චි කරමින් ජවිපෙ එහි සංවිධාන යන්ත්‍රය හසුරුවනු ලැබේ. ඔවුන්ගේ එකම දේශපාලන ඉලක්කය මැතිවරණයක් ලබා ගැ2නීමය. කල්දැමූ පළාත් පාලන මැතිවරණය ''කොකක්කේන් හා කෙක්කෙන් '' ලබා ගන්නා බව අනුර කුමාර කියා සිටියේය. එකී ප්‍රකාශ වලින් කළේ තම සාමාජිකයන්ට බලාපොරෙත්තු ඇති කිරීමට කටයුතු කළේය. පළාත් පාලන මැතිවරණ ඉල්ලා කොළඹට කැඳවූ උද්ඝෝෂණයේදී අපේක්ෂකයකු මිය ගියේය. එම මිය ගිය අපේක්ෂකයාගේ මරණය ඉතාම සාමකාමී ලෙස මිහිදන් කිරීමට කටයුතු කළේය. සුදු වස්ත්‍රාභරණයෙන් සැරසුනු ජවිපෙ නායකයින් එම මරණයට දේශපාලය ගෞරවයක් හෝ ලබාදීමට කටයුතු කළේ නැත. මේ මගින් ඔවුන්ගේ දේශපාලන බංකොලොත් බව රට ඉදිරියේ ප්‍රදර්ශනය විය. ඔවුන් සාමකාමී පක්ෂයක් ලෙස රට ඉදිරියේ ප්‍රදර්ශනය කරමින් වෙළඳපොළ බලවේග මත පදනම් වී ධනපති ව්‍යාපාරිකයින්ගේ අනුකූලත්වය මත පක්ෂ ව්‍යුහය ගොඩ නැගීම එකම අපේක්ෂාව බව දකින්ට හැකි වේ. බටහිර තානාපතිවරුන් හමුවේ ජ්‍යාතන්තර සහයෝගය ලබා ගැනීමටද කටයුතු කරමින් සිටියි. මේ අනුව අනුර කුමාර විකල්ප ධනපති පන්තියේ අපේක්ෂකයා බවට බත් කිරීමට උත්සාහ කරමින් සිටී.

### ජාජබයේ ඉන්දියානු සංචාරය

අනුර කුමාර ඇතුළු පිරිසට ඉන්දියාවට එන්න යැයි ආරාධනා කළේ ඉන්දියාවේ ICCR හෙවත් ඉන්දියන් කවුන්සල් ඔෆ් කල්චරල් රිලේෂන්ස් ආයතනය බව වාර්තා විය. එය ඉන්දියානු විදේශ සේවා අමාත්‍යංශය යටතේ පවතින ස්වාධින ආයතනයකි. ඉන්දියාව අවට සිටින සහෝදර රටවල් සමඟ සම්බන්ධතා පැවැත්විම මේ ආයතනයේ ක්‍රියා පටිපාටිය බවට පත් වේ. යම් නියෝජිතයෙකු ඉන්දියාවට එන්නට ආරාධනා කළ විට එම නියෝජිතයන්ට අවශ්‍ය වැඩසටහන් කුමක්ද යන්න සැලසුම් කිරීම ඔවුන් කරනු ලබයි. මෙම අයි. සී.සී ආර් ආයතනය අනුර ඇතුළු නියෝජිත පිරිසට ඉන්දියාවේ දිල්ලි, අහමදාබාද් හා ත්‍රිවේන්ද්‍රම් යන ප්‍රදේශවල සංචාර සැලසුම් කොට තිබුණ. ව්‍යාපාරිකයන් හමුවීම ඇතුළු කර්මාන්තශාලා, කෘෂිකාර්මික මධ්‍යස්ථාන රාජ්‍ය ආයතන ආදී විවිධ සංචාර හා හමුවීම් මේ පිරිස වෙනුවෙන් සංවිධානය කර තිබූ බව වාර්තා විය.

ජාජපය ආරම්භ කර ඇති දේශපාලන ගමන් මඟට මේ හැර වෙනත් මාවතක් නොමැත. ධනේශ්වර නොවන සංවර්ධන මාවතක් පිළිබඳ 1970 දශකයේ ල.ස.ස.ප, කො.ප යන පක්ෂ පෙනී සිටියේ එම යුගයේ නැගෙනහිර යුරෝපීය රටවල් වල එවැනි රාජ්‍යයන් ගොඩනැගී තිබූ නිසාවෙනි. ඒ වන විට ඔවුන් ඉදිරිපත් කළ තර්කවල යම් දේශපාලන පදනමක් තිබුනි. එත් වත්මන් ජා.ජ බලවේගයේ නායකයින්ට එවැනි කිසිදු දේශපාලන දැක්මක් නොමැති බව පෙනේ. ජාවිපෙ ඉතිහාසයට ඉන්දියානු විරෝධි වූවක්ය. එහි නිර්මාතෘවරයා රෝහණ විජේවීර බව මුළු සමාජයම දැන සිටියේය. එය අතිශය මිත්‍ය අරමුණු අනුව ජවිපයේ දේශප්‍රේමී දේශපාලනයට සිංහල පීඩිත තරුණ තරුණියන් ආකර්ෂණය කර ගැනීමට ගොඩනැගූ මතවාදයකි. අද වන විට වත්මන් නායකයින් අංශක 180 වක් හැරෙමින් සිටින බව පෙනේ. ඇමරිකානු ගෝලීය බලවතා මේ වන විට චීනයට එරෙහි ඉන්දියාව මුල් කරගත් දේශපාලන බලයක් ගොඩනැගීමට උත්සාහ කරමින් තිබේ. එහි මූලික අරමුණ ගෝලීය ධනපති ක්‍රමයේ වත්මන් අර්බුදයට මුහුණ දීම සඳහා අනුගමනය කරන උපායක් බවට පත්වී තිබේ. එම අරමුණින් කලාපීය රටවල් සම්බන්ධ කර ගැනීම ගෝලීය බලවතුන් ට උවමනා වී තිබේ. ජා.ජබයට භූ දේශපාලනය තුළ වෙනත් සංවිධාන මාවතක් ඉතිරි වී නොමැති බව පෙනේ. මෙමගින් පෙනී යන්නේ ජාජබයේ අනාගත දේශපාලන ගමන් මගද තීන්දු වන්නේ ජාත්‍යන්තර මූල්‍ය අමුදල සහ ලෝක බැංකුව වැනි අධිරාජ්‍ය වාදී මූල්‍ය ආයතනවල කොන්දේසි හා උපදෙස් අනුව ක්‍රියා කිරීමය.එකී මාවත හැර වෙන්ත මාවතක් ඉතිරි වී නොමැත. ශ්‍රී.ල.නි.පයේ නොබැඳි ප්‍රතිපත්තියද අනුගමනය කිරීමට ජා.ජබය ක්‍රියා කරන්නේ මේ නිසාය.■

ප්‍රේමචන්ද්‍ර විතාණවසම්

# ජාජබ ය – සජබ ය භික්ෂූන් හා හමුදා සංවිධාන ගොඩනැගීමේ බලපොරයක්..!

ආගමික හා රණවිරුවන් දේශපාලනයට කැඳවාගෙන ඒමේ ආරම්භක අයිතිකරුවන් ලෙස රාජපක්ෂ පවුල පසුගිය මැතිවරණ වලදී කටයුතු කළා. නමුත් රාජපක්ෂ පවුලට දේශපාලන බලය අහිමිවන විට මේ භික්ෂුන් හා රණවිරුවන් ද ඉවත්ව යන බව දක්නට ලැබුණා.

වර්තමානය වන විට එම සංවිධාන ආකෘතිය ඇති කිරීමට ජා.ජබය හා ස.ජබය කටයුතු කරමින් තිබෙන බව පෙනී යනවා. අදවන විට විශ්‍රාමික ත්‍රිවිධ හමුදා සාමාජිකයින් දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කිරීමට මේ වන විට ජජබය ක්‍රියා කරමින් යනවා. බොහෝ දේශපාලන පක්ෂවලට කම්කරු, තරුණ, කාන්තා හා සංවිධාන ද භික්ෂු සංවිධාන ද තිබුණත් ඔවුන් තම පක්ෂ ආකෘති වලට බාහිරව ඒවා ගොඩ නැගීමට ක්‍රියා කළේ නැහැ. විශ්‍රාමික හමුදා සාමාජික සංවිධාන තිබුනෙත් නැහැ. හමුදාව දේශපාලනයට කැඳවා ගෙන ඒම


හිටපු 14 වන නාවික හමුදාපති දයා සඳගිරි, සමගි ජන බලවේගයට සහය දෙන බවට ප්‍රතිඥා දුන් අතර, මේ වන විට එම පක්ෂයට එක් වන අවම වශයෙන් තුන් වන හමුදා නායකයා ඔහුය..



ආරම්භ කළේ රාජපක්ෂවරුන් බව දකින්නට ලැබුණා. ඒත් පොහොට්ටු පක්ෂයට වුවද තවමත් එවැනි විශ්‍රාමික හමුදා සංවිධාන නැහැ. මෙවන් සංවිධානයක් ගොඩ නැගීම තුළින් ජාජබය කළේ රාජපපක්ෂවරුන් නිර්මාණය කළ රණවිරු දේශපාලනයට නව අරුතක් ලබාදීමයි. සජිත් ප්‍රේමදාස මේ මාවත අනුගමනය කරමින් රණවිරුවන්ගෙන් කැල්ලක් කඩා ගැනීමට උත්සහ කරමින් සිටින බව පෙනී යනවා. යම් තත්ත්වයක් තුළ ජා.ජබයට ජනාධිපතිවරණයෙන් ජය ගත හොත් ඉදිරි පාර්ලිමේන්තු මැතිවරණයේදී වැඩි මැතිවරණ කොට්ඨාශ ප්‍රමාණයක් ඔවුනට ලබා දීමට සිදුවෙනවා. රාජපක්ෂවරුන් ඔවුන්ගේ ආණ්ඩුකාලයේ සිවිල්

➦8

සුනිල් ශාන්ත



## මාර්තු 08 ජාත්‍යාන්තර කාන්තා දිනය වෙනුවෙන්

ප්‍රදීපා දමයන්ති දේවගේ

ජාත්‍යාන්තර කාන්තා දිනය මාර්තු 08 වනදාට යෙදී තිබෙනවා. මෙම දින ඉතිහාසය පුරා චාරිත්‍රයක් ලෙස සමරනවා හැරෙන්න ස්ත්‍රී විඳින පීඩිත ජීවිත වෙනස් කිරීමට අඛණ්ඩ පෙනී සිටින බවක් දකින්නට නැහැ. එම දිනය අදවන විට විලාසිතාවක් බවට පත්වෙළා. එය සමරන්නේ යුතුකමක් විදියට බවයි පෙනී යන්නේ. මෙම තත්ත්වය වෙනස් කළ යුතුයි. මේ සඳහා හැකියාව ඇත්තේ විප්ලවකාරී මතවාදයක් හා සමාජවාදී වැඩ පිලිවලක් වෙනුවෙන් සටන් කරන අයටයි. කාන්තා දිනය කියන්නේ තවත් අර්ථයකින් වැඩකරන ස්ත්‍රීන්ගේ දිනයටයි. එය ආරම්භ වුනේ වැඩකරන ස්ත්‍රීන්ගේ අරගල දිනයක් හැටියටයි.

19 වන වර්ෂයේ අගභාගයෙන් 20 වන සියවසේ මුල් කාලයේ ඇමරිකා එක්සත් ජනපදයේ වැඩකරන ස්ත්‍රීන් සහ යුරෝපයේ රටවල වැඩකරන ස්ත්‍රීන් ශ්‍රමයට සරිලන වැටුපක් ඉල්ලා සිටීම සහ දිනකට පැය දහයක වැඩ දිනයක් කරන ලෙස ඉල්ලා සටන් කිරීමට දිගටම ආරම්භ කළා. එහි ප්‍රතිඵලයක් හැටියට තමයි 1910 කොපන්හේගන් නුවර පැවති සමාජවාදි කාන්තා සමුළුවක් වැඩකරන කාන්තා වන්ගේ මුලිකත්වයෙන් පැවැත්වීමට තීරණය කළේ. ජාත්‍යාන්තර සමාජවාදි ව්‍යාපාරයේ ප්‍රධාණ නායකත්වය වු ක්ලේරා සෙට්කින් යෝජනාවක් ඉදිරිපත් කළේ. එම යෝජනාවට අනුව 1911 සිට හැම වසරකම මාර්තු 8 වනදා ජාත්‍යාන්තර කාන්තා දිනය වශයෙන් ලොව පුරා සැමරීමට තීන්දු කරන්නේ. 1917 රුසියාවේ ආරම්භ වු ඔක්තෝම්බර් සමාජවාදී විප්ලවයට මගපැදු පෙබරවාරි විප්ලවයේ මුල් ගිනිපුපුර පත්තු කිරීමට මෙය ආරම්භයක් වුණා. එවකට පෙට්‍රොගෑඩ් නගරයේ ඇඟළුම් කර්මාන්තවල සේවය කළ කම්කරු ස්ත්‍රීන්ගේ අරගලයකින් මෙයට පසුබිම සකස් කළා.

### වෙළඳ භාණ්ඩයක් කිරීම

ලාංකේය සමාජය තුළ වැටුප් සඳහා ශ්‍රමය වැය කරන විශාල කාන්තාවන් පිරිසක් සිටිනවා. වතුකරයේ හා මැදපෙරදිග අර්ධ වහල් සේවාවල නියලි සිටින ස්ත්‍රීන් ජීවිතය පවත්වාගෙන යන්නට මාරාන්තික සටනක් කරනවා. මේ වන ක්‍රියාවට නැගෙන නව ලිබරල් ආර්ථිකය (විවෘත ආර්ථිකය) විසින් එම කාන්තාව වෙළඳ භාණ්ඩයක් බවට පත් කරළා ඇයගේ සුකුමාලා ඇඟපසඟ ප්‍රදර්ශ

ජාත්‍යාන්තර කාන්තා දිනය මාර්තු 08

වනදාට යෙදී තිබෙනවා. මෙම දින ඉතිහාසය පුරා චාරිත්‍රයක් ලෙස සමරනවා හැරෙන්න ස්ත්‍රී විඳින පීඩිත ජීවිත වෙනස් කිරීමට අඛණ්ඩ පෙනී සිටින බවක් දකින්නට නැහැ. එම දිනය අදවන විට විලාසිතාවක් බවට පත්වෙළා. එය සමරන්නේ යුතුකමක් විදියට බවයි පෙනී යන්නේ. මෙම තත්ත්වය වෙනස් කළ යුතුයි. මේ සඳහා හැකියාව ඇත්තේ විප්ලවකාරී මතවාදයක් හා සමාජවාදී වැඩ පිලිවලක් වෙනුවෙන් සටන් කරන අයටයි. කාන්තා දිනය කියන්නේ තවත් අර්ථයකින් වැඩකරන ස්ත්‍රීන්ගේ දිනයටයි. එය ආරම්භ වුනේ වැඩකරන ස්ත්‍රීන්ගේ අරගල දිනයක් හැටියටයි. ණය කරලා විශාල මුදල් සොයනවා.

පවතින ධනේශ්වර අධ්‍යාපනය තුළ නෛතික පදනමක් දීම අතිශය ශෝචනීයයි. ප්‍රාග්ධනය හිමි (දේපල හිමි) පංතිය විසින් සකස් කරනු ලැබු සමාජ ආර්ථික පදනම ඉදිරියට ගෙන යාමට පුරුෂයා සහ කාන්තාව අතර අසමානතාවයක් නිර්මාණය කර තිබෙනවා. කාන්තාව නිවසට ගාල් කිරීම රදළ සමාජ තුළ දිගින් දිගටම සිදු කළා. ඒ සඳහා නීතිමය සදාචාර පහසුකම් එම සමාජය ව්‍යුහයන්ගේ පැවැත්මට සම්බන්ධ කළා. මේ ඊනියා නෛතික බැමි බිඳ දැමීමට පුරුෂයන් ක්‍රියා කරන්නේ නෑ. බොහෝ පුරුෂයින් කාන්තා විමුක්තිය වෙනුවෙන් කතා කළත් එය භාවිතයට දමන්පේටු 05න් නැහැ. තම නිවස තුළ දී

ගැනීමට කාන්තා ශරීරයේ අඟපසඟ ප්‍රදර්ශනය කර විශාල ඡායාරූප මඟ දෙපස ප්‍රදර්ශනය කරමින් තිබෙනවා. එම ඡායාරූපවල සරාගී බැලුම් හෙලන කාන්තා රූප ආහාර ද්‍රව්‍ය වාහන වර්ග බෙහෙත් හේත් පමණක් නොව කෘෂිරසායනික වර්ග අලෙවි කරගැනීමට යොදා ගනිමින් තිබෙනවා. ''කැරොකේ''වැනි සමාජ ශාලාවල කාන්තාවන් සිය ලිංගිකත්වය මුදලට විකිණීමට පෙළැඹී ඇති නිසාම ලිංගික සුරාකෑමට ලක් වී තිබෙනවා.

ගණිකා වෘත්තීය පන්ති සමාජයේ මුලාරම්භය දක්වා දිව යමින් තිබෙනවා. අද වන විට ගණිකා වෘත්තීය ප්‍රධාන

අයිතිය කාන්තාවන්ට අහිමි කර දිය යුතුය. මෙම පීඩාවන්ට එරෙහි සංස්කෘතිකමය, නීතිමය සහ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ පිළිබඳ සංවාද ද පසුගිය සියවස පුරා අඩුවැඩි වශයෙන් පැවතුනා.

වෙළඳපොල බලවේග විසින් නිර්මාණය කරනු ලබන විකෘති සමාජ වටපිටාව ලිංගිකත්වය උද්දීපනය කිරීමට පසුබිම සකස් කර තිබෙනවා. ලිංගිකත්වය ජීව විද්‍යාත්මක අවශ්‍යතාවයක්. එම අවශ්‍යතාවයන් මුදුන්පත් කරගැනීමේ සමාජ සදාචාරයක් වෙළෙඳපොල ආර්ථික වටපිටාව තුළ නොමැත. සියළු මිනිස් අවශ්‍යතාවයන් මුදල්වලට යටපත් කර

වන්දි ගෙවීමට සිදුවන අපරාධයන්හි ගොදුරක් බවටත් ඇය පත්වෙලා. ස්ත්‍රීන්ට සහ ළමයින්ට රැකවරණය දීමට බැරි සමාජයක් නිරෝගී සමාජයක් වශයෙන් සලකන්න බැහැ. සමාජයේ බොහෝ දෙනා ෆැෂන් එකට වගේ කියන සොරි කියන වචන දෙකට හැබෑ අරුතක් දෙන්න නම් සමාජයේ vulnerable කියන කොයි මොහොතේ වුනත් අවදානමකට ආපදාවකට ලක්විය හැකි වෙනවා මේ කොටස් දෙකේ ආරක්ෂාව සහතික කළයුතු වෙනවා. එහෙත් ස්ත්‍රිය ලිංගික භාණ්ඩයක් වශයෙන් හෝ ගෙදරදොර වැඩ සඳහා හීලෑ කරන ලද සතකු අයුරින් සැලකීමට පුරුදු වු සමාජයකින් රැකවරණය බලාපොරොත්තු වීම නිරර්ථකයි.

ලෝකයේ පළමුවැනි අගමැතිනිය සහ විධායක ජනාධිපතිවරියක් බිහිකළ රටක් මේ රට. ඒත් අපේ ස්ත්‍රී වර්ගයා පෙළන දහසක් බන්ධන මේ රටේ තාමත් ක්‍රියාත්මක වෙනවා. කාන්තා විමුක්තියක් ගැන අප කතා කළාට විමුක්තිය තබා හුස්ම ගන්න ඉඩක්වත් නැති තත්වයක් තමයි කාන්තාවන්ට උදාවෙලා තියෙන්නෙ. ස්ත්‍රීය ශ්‍රමය වශයෙන් සහ ලිංගික වශයෙන් සුරාකෑම මත
කාලයේ බෙහෙවින් ඉහළ ගොස් ඇති බව තමයි දැනට පේන්නත් තියෙන්නෙ. ආසියාව, අප්‍රිකාව ඇතුළු අඩු දියුණු ලෝකයේ රටවල ලාභ ශ්‍රමය සහ ලිංගික වහලුන් වශයෙන් ස්ත්‍රිය පෙළන පීඩනය එන්න එන්නම වැඩිවන තත්ත්වයක් තමයි තියෙන්නේ. කාන්තා ශ්‍රමය සහ ලිංගිකත්වය වෙළෙඳපොළේ අලෙවි කරන්න පුළුවන් වෙළෙඳ ද්‍රව්‍යයක් (commodity) බවට පත්කරගෙන ධනේශ්වර ක්‍රමය විසින්, ආදරය පවා අලෙවි කරන්න ධනපති වෙළඳපොල නොපැකිලෙන බව අප දුටුවා. පෙම්වතුන්ගේ දිනය වැනි අවස්ථාවලදී. ලාභ පොදිගැසීමේ ධනවාදී උවමනාව වෙනුවෙන් ධනපතියන් නොවිකුණන දෙයක් නැහැ.



# මානුෂත්වයට නිගා කරන දූෂිත මජර සමාජය පෙරළා දමමු..!

> ධනේශ්වර සමාජය තුළ කාන්තාව වෙළඳ භාණ්ඩයක් ලෙස පරිභෝජනය කිරීමට වෙළඳ පොල බලවේග ක්‍රියා කරමින් තිබෙනවා. වෙළඳපොල භාණ්ඩ අලෙවි කර ගැනීමට කාන්තා ශරීරයේ අඟපසඟ ප්‍රදර්ශනය කර විශාල ඡායාරූප මඟ දෙපස ප්‍රදර්ශනය කරමින් තිබෙනවා. එම ඡායාරූපවල සරාගී බැලුම් හෙලන කාන්තා රූප ආහාර ද්‍රව්‍ය වාහන වර්ග බෙහෙත් හේත් පමණක් නොව කෘෂිරසායනික වර්ග අලෙවි කරගැනීමට යොදා ගනිමින් තිබෙනවා. ''කැරොකේ''වැනි සමාජ ශාලාවල කාන්තාවන් සිය ලිංගිකත්වය මුදලට විකිණීමට පෙළැඹී ඇති නිසාම ලිංගික සුරාකෑමට ලක් වී තිබෙනවා.

කායික ශක්තිය අතින් ස්ත්‍රීන් පුරුෂයාගේ කායික ශක්තියට වඩා අඩු බවට සමාජ මතයෙන් තහවුරු කරනවා. ජීව විද්‍යාත්මකව මෙහි කිසිඳු සත්‍යතාවයක් නැත. නමුත් කාන්තාව සහ පුරුෂයගේ කායික වෙනස්වීම් පැවතීම පිළිබඳ විවාදයක් නැහැ. මේ අතර කාන්තාවගේ ඇඟපත සුකුමාල සියුමැලි බවට අරුත් ගන්වමින් පුරුෂයාගේ කායික ශක්තිය හා මානසික ශක්තිය වැඩි වේයැයි වියුක්ත ලෙස හා වංචනික ලෙස මිත්‍යා මත ගොඩනැගීමට විවිධ ආගම්වල අර්ත ගන්වන මතවාදයක් සමාජ ගත කරනවා. මේ මතවාදයන්ට පුරුෂ විරෝධි අධිපත්‍යයද පාවිච්චි කරනවා. පුරුෂාධිපත්‍ය තුළ මතුවන ප්‍රචණ්ඩත්වය පාවිච්චි කරමින් කාන්තාවන්ගේ මටසිළුටු සුකුමාල බව පෙන්වා දෙමින් ජීව විද්‍යාත්මක නොවන කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරනවා. කායික ශක්තියෙන් පමණක් නොව බුද්ධියෙන් ද පුරුෂයා ඉදිරියෙන් සිටින බවට ආගමික මිත්‍යා මත පතුරවනවා. මේ සඳහා ආගමික මතවාද ඉදිරියට ගන්නවා. ගැහැණු කවුරුද වරදෙ නොබෙදෙන'' යන ජනකතා වල පැරණි යෙදුම් ප්‍රචාරය කරනවා. මේ මිත්‍යාමත පතුරවා හැරීමට පාලකයින් සංස්කෘතින් යොදා ගැනීම දක්නට හැකි වෙනවා. මේ සඳහා අද

කාන්තාව මෙහෙකාරියක් බවට පත්කර ගන්නවා. පුරුෂයාගේ මෙහෙකාරකමට ඇය යොදා ගැනීම බොහෝ විට දකින්ට හැකි වෙනවා. පවතින ධනපති සමාජයේ ගැඹුරු පිරිහීම්වලින් බැට කන කාන්තාවගේ නිදහස හා විමුක්තිය දිනා ගැනීමට මේ සමාජය පෙරළා දැමීමට ඇයගේ පූර්ණ දායකත්වය අවශ්‍ය බව අවධාරණය කළ යුතුයි.

### කාන්තාවන් කුරිරු ලෙස දූෂණය කිරීම තුළ මතු වන මිලේච්ඡත්වය

**කාන්තා ප්‍රචණ්ඩත්වයට සහ හිංසනයට එරෙහිව ගොඩනැගෙන හඬ පසුගිය දශක කීපය පුරා දක්නට ලැබුණා. පසුගිය දශක වල ප්‍රණ්ඩත්වය ලෙස අර්ථ දැක්වූයේ කාන්තාවන්ට ගුටි බැට දීම සහ ශාරීරික පහරදීම් වලට ලක් කිරීමයි. කාන්තාවන් වීම නිසාම සුවිශේෂ ප්‍රචන්ඩත්වයට මුහුණු දීම ඉතිහාසය පුරා දකින්නට ලැබුණා.**

ධනේශ්වර සමාජය තුළ කාන්තාව වෙළඳ භාණ්ඩයක් ලෙස පරිභෝජනය කිරීමට වෙළඳ පොල බලවේග ක්‍රියා කරමින් තිබෙනවා. වෙළඳපොල භාණ්ඩ අලෙවි කර

කර්මාන්තයක් බවට පත් වෙලා. කාම චිත්‍රපට රඟපෑම්වලට තෝරාගන්නා කාන්තාවන්ගේ ලිංගිකත්වය එම වෘත්තියේ කොටසක් බවට පත් කළා. මේ කර්මාන්වල වල යෙදෙන ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව සහතික කරන කිසිඳු සුභ සාධක හිමිකමක්වත් ඔවුන්ට නැත. ගණිකා වෘත්තිය නීතිගත කර ඇති සමාජයන් ලෝකයේ බොහෝ විට දකින්ට හැක. වැඩවසම් සමාජ බැමි නිසාද ආගමික මිත්‍යා මත වලින් ගණිකා වෘත්තිය නීති ගත කිරීමේ කතිකාව යටපත් කිරීමට ක්‍රියා කරමින් තිබෙනවා. එම පසුගාමී සමාජ වටපිටාව තුළ ගණිකා වෘත්තිය නීතිගත කිරීමේ කතිකාවට ඉඩ දෙන්නේ නැහැ. ඇයගේ ශරීරය පිළිබඳ තීරණ ගැනීමේ

තිබෙනවා. එම අවශ්‍යතාවන් ලබා ගැනීමට සදාචාරමය සමාජ වටපිටාවක් නැහැ. කළු ආර්ථිකය තුළ මුදල් සොයන ව්‍යාපාරික පංතිය සියල්ල මිනිස් අවශ්‍යතාවයන්ට යට කරලා.

කාන්තාවන් ගැන ක්‍රියා කරන්න බැඳී සිටින අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු කාර්‍යාංශ, පොලිස් ඒකක ගණනාවක් රටේ පිහිටුවල තියෙනවා. එක අතකට ස්ත්‍රීන්ගේ ශ්‍රමය සුරාකන අතර අනෙක් අතට ස්ත්‍රීන්ගේ ආරක්ෂාව පිළිබඳ බරපතළ ගැටළුවක් මේ වන විට නිර්මාණය වී තියෙනවා. ස්ත්‍රිය අනාරක්ෂිත තත්ත්වයකට පත්වෙලා. අද වනවිට ලිංගික වශයෙන් ස්ත්‍රීන් බරපතළ අපයෝජනයන්ට ලක්වන අතර ජීවිතවලින්

මේ තත්වය වෙනස් කරන්න පුළුවන් වෙන්නෙ හුදු ස්ත්‍රීවාදී අරගලවලින් නෙවෙයි. ධනේශ්වර ක්‍රමය විසින් උද්ගත කර ඇති කාන්තා පීඩනය කියන එක කාන්තාවන්ගේ ප්‍රශ්ණයක් විතරක් නෙවෙයි. එය මුළු මහත් සමාජයටම බලපාන පොදු ප්‍රශ්නයක්. ධනපති පන්තිය විසින් නිර්ධන පන්තිය සුරාකන සමාජයක් තුළ එය පන්ති ප්‍රශ්ණයක්. ඒ නිසා තමයි සමාජවාදීන් හැටියට අප කුමන ආකාරයකින් හෝ ස්ත්‍රීන් සුරාකනු ලැබීමට එරෙහිව පෙනී ඉන්නේ. සටන් කරන්නෙ. හුදු ස්ත්‍රීවාදීන් හඬ නගන කාන්තා විමුක්තිය සාක්ෂාත් කරගන්න පුළුවන් වෙන්නෙ සුරාකෑම, පන්ති විෂමතාව අහෝසි කළ සමාජවාදී සමාජයක් බිහිකිරීමෙන් විතරයි. ■





# ජවිපෙ ඉතිහාසයෙන් බිඳක්..




**1965** ජවිපෙ බිහි විමට පසුබිම සකස් වුයේ සාම්ප්‍රදායික වමේ පක්ෂ ලෙස තිබු ලංකා සම සමාජ පක්ෂය සහ කො.ප. ශ්‍රී.ල.නි.ප සමඟ හවුල් ආණ්ඩුවකට ඇතුල් වීමේ ගැඹුරු දේශපාලන සංසිද්ධියක ප්‍රතිඵලයක් ලෙස බව පසුගිය කාලය පුරා කථිකාවට බදුන් වී තිබුණි. 1953 හර්තාලයෙන් ප්‍රකාශයට පත් කෙරුනා වු 1950 ගණන්වල කම්කරු පන්තියේ පෙරලිකාරීත්වයට වළ කැපීම සඳහා ඇවිස්සු ශ්‍රීලනිපයේ සිංහල අධිපතිවාදයට ල.ස.ස.ප අනුගත වීමය. මෙම සාම්ප්‍රදායික පක්ෂ අනුගමනය කරනු ලැබු පන්ති සහයෝගීත්වය දේශපාලනයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවු විකෘති දේශපාලන ප්‍රපංචය වුයේ ජවිපෙ බව දකින්නට හැකි විණි. ජවිපෙ බිහි වීමේ සිට එහි පන්ති පදනම සුළු ධනේෂ්වර වු අතර ගැමි ගොවි සමාජ බලවේග අතර ඔවුන් දේශපාලන කටයුතු කරමින් තිබුණි. ස්ටැලින්වාදී කොමියුනිට් පක්ෂයේ සාමාජිකයෙකු වී සිටි විජේවීර එම කණ්ඩායමෙන් ඉවත් වී ලංකා කොමියුනිට් පක්ෂය ලෙස පෙනී සිටි මාඕවාදීන් සමඟ එකතු වී කටයුතු කරන ලදී. පසුව එම පක්ෂයෙන් ද ඉවත්වී ජවිපෙ ගොඩ නැගීමට කටයුතු කළේ ය. ස්ටැන්ලින්වාදය හා සිංහල ජාතිවාදය ඔවුන්ගේ මාතවාදයේ පදනම බවට පත් විණි. ජාතික විමුක්තිය හා දේශප්‍රේමය ඔවුන්ගේ සටන් පාඨවල අන්තර්ගත විය. ''ජනතාවට විමුක්තිය'' අධිරාජ්‍යවාදයට විනාශය'' මව්බිම නැතිනම් මරණය'' වැනි සටන්පඨ 1971 දි කැරුල්ලට පෙර සිට තාප්ප බිත්ති වල විශාල අකුරින් ලියන්නට කටයුතු කළේ ය. කම්කරු පන්තිය හෙවත් නිර්ධණ පන්තිය විප්ලව වාදී බලවේග ලෙස අර්ථ ගැන්වුයේ නැත. මේ නිසාම මාක්ස්වාදී මුලික පන්ති විග්‍රහයක් ඔවුන්ට නොමැති විණ. නිර්ධණ පන්තිය ලෙස විග්‍රහ කරන්නට කටයුතු කළේය. ඔවුන් මුල සිටම ජාතික සීමාවක් මත පදනම් වී කටයුතු කළේ ය. මේ නිසාම දේශියත්වයට ගැළපෙන මතවාදයක් අවශ්‍යයැයි කියමින් කරනු ලැබු කරුණු දැක්වීම් වලින් ගම්‍ය වුයේ නිර්මාක්ස්වාදි දේශපාලනය මුල සිටම තිබු බවයි. ලාංකීය දේශපාලනයේ ප්‍රධාන ධනපති පක්ෂවලින් වෙන්වී කටයුතු කරන බව කියා සිටියත් මුළු ඉතිහාසය තුළම එම පක්ෂ බලයට පත් කිරීමේ කටයුතු වලට දායක වී තිබේ. පැරණි වාමාංශික පක්ෂ අනුගමනය කරනු ලැබු ධනපති හවුල් ආණ්ඩු දේශපාලනය ප්‍රතික්ෂේප කරනු ලැබුවත් 1980 දශකය වනවිට ජවිපෙ විවෘතව එම ධනපති පක්ෂ සමඟ එකතු වී මැති ඇමතිකම් ලබා ගැනීමට කටයුතු කළේ ය. 1994 චන්ද්‍රිකා ආණ්ඩුව සමඟ පරිවාසයකට යන්නට තීරණය කළේ ය. මේ ගමන් මඟ තුළ ඉතිහාසයේ තීරණාත්මක පාවාදීම කරනු ලැබුවේ 2005 දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බවට පත්කිරීමට ගනු ලැබු තීන්දුවක් සමඟය. ඔවුන් එම මැතිවරණයේ කියා සිටියේ මහින්ද රාජපක්ෂ දේශමාමක බලවේගවල නියෝජිතයා බවත් රනිල් වික්‍රමසිංහ විජාතික බලවේගවල නියෝජිතයා බවත් ය. එල්.ටී.ටී.ඊ. බෙදුම්වාදය පරාජය කිරීම ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයේ අංක එක බවට පත් කර ගන්නා ලදී.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා බවට පතත් කර ගැනීමේ ප්‍රචාරක යාන්ත්‍රණයේ ප්‍රධාන කොටස් කරුවා බවට ඔවුන් පත්විණ. ජවිපෙ නොසිටියානම් මහින්ද රාජපක්ෂ බලයට පත් කිරීමට නොහැකි වනු ඇත. මෙවන් තත්වයක් තුළ වසර 75 ක ඉතිහාසයේ විනාශයට ඔවුන්ද වගකිව යුතුව තිබේ. එයින් ගැලවීමට ජවිපෙ ගන්නා උත්සාහයට කිසිදු දේශපාලන පදනමක් නොමැත.විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ බෙදුම් වාදය පරාජය කිරීමට හිටපු හමුදා පතිවරයෙකු වු සරත් ෆොන්සේකා තම පක්ෂයේ අපේක්ෂකයා බවට පත් කර ගන්නා ලදි. මේ මඟින් ඔවුන්ගේ දේශපාලන නිරුවත දක්නට හැකිවිණ. එවන් පසුබිමක් තුළ ජවිපෙ ඉතිහාසයට එකතු වී ඇත්තේ දෙමළ ජාතිය සංහාරය කිරීමට උඩගෙඩි දුන් පක්ෂයක් ලෙසය. ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳීම හැක්කේ අනාගතයේ ගොඩනගන සමාජවාදි පාලනයකින් බව පසුගිය දශකවලදී කියා සිටියේ ය. මේ වන විට ඒකීය ලංකාවක් තුළ පළාත් සභාවක ජාතික ප්‍රශ්ණයට විසදුම් ලාබ දිය යුතුයැයි ප්‍රකාශ කරමින් සිටි. 1988, 1989 ඔවුන් පළාත් සභා මැතිවරණ වර්ජනය කළ යුතු බවත්, එම මැතිවරණයේ ඡන්දය ඉල්ලා සිටින්නන් ජාති ද්‍රෝහින් බව කියා සිටියේ ය. ඔවුන් අනුගමනය කරනු ලැබු මේ ක්‍රියා මාර්ගයන් පළාත්සභා ඡන්දය ඉල්ලා සිටි වාමාංශික ක්‍රියාකාරීන් විශාල ප්‍රමාණයක් ඝාතනය කළේ ය. අවම වශයෙන් මේ අනුගමනය කරනු ලැබු වැරදි හා පුද්ගලික ත්‍රස්තවාදි විධික්‍රමය පිළිබඳ කිසිඳු ස්වයං විවේචනයක්වත් මේ වන තෙක් ඉදිරිපත් කළේ නැත. ■

විල්ෆ්‍රඩ් සිල්වා

මහින්ද හත්තක

## ලංකාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

# දූෂණයට දොර ඇරලා

## -වෙරිටේ රිසර්ච් කියයි..



පවතින රාජ්‍ය ප්‍රසම්පාදන නියාමන රාමුව වංචා සහ දූෂණයේ යෙදෙන සමාගම් අසාදු ලේඛන ගත කිරීමට අසමත්වීමෙන් මහජන මුදල් අවභාවිතයෙන් සහ සොරා ගැනීමෙන් වැළැක්වීමට නොහැකිව ඇතැයි වෙරිටේ රිසර්ච් ආයතනය පසුගිය දා නිකුත් කළ සමීක්ෂණ වාර්තාවකින් අවධාරණය කරයි.
එම වාර්තාවේ සඳහන් වන ආකාරයට මෙම තත්වය අප්‍රමාදව නිවැරදි කිරීමට පියවර දෙකක් ගත යුතුය. ඉන් පළමු වැන්න නීතියේ ඇති හිඩැස පියවිය යුතුය. පවතින ප්‍රසම්පාදන මගපෙන්වීම් අනුව වංචා සහ දූෂණ ක්‍රියාවල යෙදෙන කොන්ත්‍රාත්තරුවෙකු හෝ සැපයුම්කරුවෙකු අසාදු ලේඛන ගත කිරීමට ප්‍රතිපාදන නැත. ප්‍රසම්පාදන මගපෙන්වීම්වලින් ප්‍රතිපාදනය කර ඇත්තේ ගිවිසුම්ගත බැඳීම් කඩ කරන හෝ අපොහොසත් වන කොන්ත්‍රාත්කරුවන් අසාදු ලෙඛන ගත කිරීමට පමණි.

දෙවැනිව අනුකූලවීමේ හිඩැස යි. එනම් ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වන/කඩ කරන කොන්ත්‍රාත්කරුවෙකු අසාදු ලේඛනයට ඇතුළත් කිරීමට මගපෙන්වීම් වලින් ප්‍රතිපාදනය කර නැත. දෙවැනි හිඩැසෙන් පෙනි යන්නේ නිතියේ හිඩැස පියවීම ප්‍රමාණවත් නොවන්නේය යන්නයි. ඉන් පෙන්නුම් කරන්නේ වංචාව සහ දූෂණය අසාදු ලේඛන ගත් කිරීමට වලංගු හේතුවක් වීමට අමතරව අනුකූලවීම සහතික කරන ප්‍රතිපාදන ද ඊට ඇතුළත්කළ යුතුය යන්නයි. නිදසුනක් වශයෙන් අනුකූල නොවීමට දඬුවම් කිරීමේ ප්‍රතිපාදන තිබිය යුතුය.

අසාදු ලේඛන ගත කිරීමේ භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව අනෙකුත් දකුණු ආසියානු රටවලට වඩා බෙහෙවින් පසුගාමී තත්වයක සිටින බවද එම වාර්තවේ සඳහන් වේ. දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවල නියාමන රාමු දූෂණ ක්‍රියාවල යෙදීම අසාදු ලේඛන ගත කිරීමට ප්‍රමාණවත් හේතුවක් ලෙස හඳුනා ගනී. ශ්‍රී ලංකාවේ මෙන් නොව මෙම රටවල අසාදුගත කළ සමාගම් ක්‍රියාත්මක මාර්ගගත දත්ත බැංකුවකට ඇතුළත් කර ඇත.

### දූෂණය නතර කිරීමට අසාදු ලේඛන ගත කිරීමේ වැදගත්කම

රාජ්‍ය ප්‍රසම්පාදනය යනු ලිපි ද්‍රව්‍ය සහ පවිත්‍රතා සැපයුම් වැනි එදිනෙදා අත්පිට මුදලට මිලදී ගන්නා භාණ්ඩ සහ සේවාවල සිට ගුවන් තොටුපොළ සහ විදුලි බලාගාර ඉදි කිරීම දක්වා රාජ්‍ය අංශය විසින් භාණ්ඩ සහ සේවා මිලදී ගන්නා ක්‍රියාවලිය යි. එය දූෂණයට බෙහෙවින් තුඩු දෙන ක්‍රියාකාරිත්වයක් වන්නේ වැය කෙරෙන විශාල මුදල් ප්‍රමාණය නිසාය. ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ප්‍රසම්පාදනය ආණ්ඩුවේ මුළු වියදමෙන් සියයට 25ක් පමණ ය. එය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 5කි. රාජ්‍ය ප්‍රසම්පාදනයේ දූෂණ සිදුවීමෙන් තරගකාරිත්වය දුර්වල කොට ගිවිසුම්ගත මිල ඉහළ යෑමට ද හේතු වේ. එය හිඟ රාජ්‍ය සම්පත් අපතේ යැවීමකි. දූෂණය නිසා රාජ්‍ය කොන්ත්‍රාත්වකින් අහිමි වන ප්‍රමාණය සාමන්‍යයෙන් කොන්ත්‍රාත්තුවේ වටිනාකමෙන් සියයට 10-25ත් අතර බව සමීක්ෂණයෙන් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ ප්‍රසම්පාදන වියදම දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 5ක්යැයි ගණන් බලන විට කොන්ත්‍රාත් පිරිවැය සියයට 20කින් ඉහළ ගිය විට එම ප්‍රමාණය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට එකකි. 2023 වසරේ ගණනය කරන ලද වියදම අනුව මෙම ප්‍රමාණය රු. බිලියන 300කට ආසන්න ය. එය 2023 වසරේ සමාජ ආරක්ෂණය වෙනුවෙන් වෙන් කරන ලද මුදල මෙන් දෙගුණයකි. තවත් ආකාරයකින් මහජන සෞඛ්‍යය සඳහා වෙන් කරන ලද මුදල වන රු. බිලියන 150ට සමාන මුදලකි.

තවත් පැහැදිලි කරන්නේ නම් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සිදුවන දූෂණ නිසා දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට එකකට සමාන ප්‍රමාණයක් ණය බරට එකතු වේ. වසර දහයක් ඇතුළත දළ ජාතික නිෂ්පාදිතයේ ණය බරට තවත් සියයට දහයක එකතු වීමකි.

කොන්ත්‍රාත්කරුවන් මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් වැළැක්වීම හෝ අසාදු ලේඛන ගත කිරීම ප්‍රසම්පාදයේ දී සිදුවන දූෂණ වැළැක්වීමේ අවියකි. ( දූෂණයට ගිවිසුම්වලට අනුකූල නොවීම ද ඇතුළත් ය.)
අසාදු ලේඛන ගත කිරීම වැනි ක්‍රියා මාර්ග එක්සත් ජාතින්ගේ දූෂණ විරෝධී සන්ධානයේ දූෂණ විරෝධී අවශ්‍යතාවයන් ට අනුකූලවීම දිරිමත් කිරීමට ආණ්ඩුවට ගත හැකි වැදගත් පියවරක් සේ හඳුනා ගෙන ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පාලනය වන්නේ 2006 ප්‍රසම්පාදන මග පෙන්වීම් සහ කැබිනට් අනුමැතියට යටත්ව 2006 ප්‍රසම්පාදන අත්පොතෙනි. මෙම මගපෙන්වීම්/ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය, ප්‍රසම්පාදනයේ දී ආණ්ඩුවේ ආයතන විසින් පිළිපැදිය යුතු නීතිය බව ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණය පිළිගෙන ඇත.

එහෙත් අසාදු ලේඛනය සකස් කිරීමේ දී දූෂණ ක්‍රියා අසාදු ලේඛන ගත කිරීමට හේතුවක් සේ යොදා ගන්නේ නැත. එය නීතියේ මෙන්ම අනුකූල වීමේ හිඩැසකි.

මගපෙන්වීම්වල 1.4.4. ඡේදය අනුව ලංසු ඉදිරිපත් කිරීමේ අවස්ථාවේ දී ''කිසියම් ත්‍යාගයක් හෝ දිරි ගැන්වීමක්''ලබා දුන් බවට වැරදිකරු වූයේනම් කළ හැකි වන්නේ ඔහු ලංසු ඉදිරිපත් කිරීමට නුසුදුස්සෙකු කිරීම පමණි. එවැනි ක්‍රියාවල යෙදුන බවට හඳුනා ගැනීම අසාදු ලේඛන ගත කිරීමට හේතුවක් වන්නේ නැත.

2019 දී ප්‍රසම්පාදන පිළිබඳ නව මගපෙන්වීම් ඇතුළත් ජාතික ප්‍රසම්පාදන කොමිසමක් යෝජනා කළ ද එම පනත පාර්ලිමේන්තුවෙන් සම්මත වූයේ නැත. එම කෙටුම් පත අනුව ද දූෂණ ක්‍රියා නිසා කොන්ත්‍රාත්කරුවෙකු දූෂිත ක්‍රියා නිසා වළක්වන්නේ එම ප්‍රසම්පාදනයෙන් පමණි. අනාගත කොන්ත්‍රාත්වලට ලංසු ඉදිරිපත් කිරීමෙන් එම කොන්ත්‍රාත්කරු වළක්වන්නේ වාස්තවික නිර්ණායක අනුව නොව ආණ්ඩුවේ ආයතනවල කැමැත්ත අනුව ය.

දකුණු ආසියාවේ රාජ්‍ය ප්‍රසම්පාදනය පාලනය වන නෛතික සහ නියාමන ක්‍රම සමාලෝචනය කිරීමේ දී ශ්‍රී ලංකාව ඉතාමත් පසුගාමී තැනක සිටින බව පැහැදිලි ය. බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින නේපාලය සහ පාකිස්ථානය වංචා සහ දූෂිතවල ක්‍රියාවල යෙදීම කොන්ත්‍රාත්කරුවන්/ සැපයුම්කරුවන් අසාදු ලේඛන ගත කිරීමට ප්‍රමාණවත් හේතුවක් ලෙස පිළිගෙන ඇත.

ක්‍රියාත්මක කිරීමේදී ද ශී ලංකාව පසුගාමී තත්වයක සිටී. නේපාලය, බංග්ලාදේශය, පාකිස්ථානය මාලදිවයින භූතානය සහ ඉන්දියාව අසාදු ලේඛන ගත කළ/සම්බාධකවලට ලක් වූ කොන්ත්‍රාත්කරුවන්/සැපයුම්කරුවන් මාර්ගගත දත්ත ගබඩාවක ප්‍රදර්ශනය කෙරේ. මෙම රටවල් සියල්ලේම ස්වාධීන ප්‍රසම්පාදන අධිකාරී නොමැකි වුවද අසාදු ලේඛන ගත කළ/ සම්බාධක පනවා ඇති කොන්ත්‍රාත්කරුවන්/සැපයුම්කරුවන් පිළිබඳ තොරතුරු මාර්ගතගතව ප්‍රකාශ කිරීමට එය බාධාවක් වී නැත.

2022 ඔක්තෝබර් 31 සම්මත කළ 21 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජාතික ප්‍රසම්පාදන කොමිසම පිහිටුවීම ද ඇතුළත් වන නිසා අසාදුගත කරන ලද සමාගම් අදාල සියලු විස්තර සහිතව මාර්ගගතව ලබා දීම සහ එම තොරතුරු යාවත්කාලින කිරීම ප්‍රමුඛතාවයක් විය යුතුය.■

**මෙම ලිපිය සකස් කෙළේ වෙරිටේ රිසර්ච් ආයතනය 2023 නොවැම්බර් මස නිකුත් කරන ලද සමීක්ෂණ වාර්තාවක් පදනම් කර ගෙන ය.**

---

### මඟ වැරදුණු මවක්..

රෝහල් කොරිඩෝවෙන් ඇසෙයි
කැහි කාරන හොටු හූරන
ජීවිතයේ සැබෑ රිද්ම
මුත්‍රා ගඳට කුණු ලේ
ගඳක් එක්ව
හමා එයි මිනී කාමරය
දෙසින් පමණක්
රෝගී සුසුම්
දරාගත නොහැකිව
වේදනාවෙන් ඇඹරෙමින්
බොල් හඬ නඟයි
විදුලි පංකාවක්
පියෙක් ඇති නමක් නැති
දරු ගැබක් දරාගෙන
දෙනෙත් ඇති කඳුළු නැති
මවක් රෝහලේ ඇඳ මත
පතොක් කටු ඇනී වණ වුණ
කෘශ පපුව පිරිමදින
ගිල දමා බඩගින්න
වතුර උගුරකින් සැනසෙන
කඳුළු වැස්සට තෙමී
සිනා බිජුවට ඉසින
කුණු බැණුම් අසා
ප්‍රිය තෙපුල් මුමුණන
අම්මා කෙනෙක් නතරව
ගැබ්බර සඳට මඟ කියන

■ශක්තික සත්කුමාර

### දාසියෝ අපි...

වෙනස් වූවද ප්‍රවේණිය
දාසයෝ නොවේ යැයි
කාට නම් කිව හැකිද
අප....

මිරිකලා ලේ නහර
ඉස්ම හිදෙනා තුරුම
වැඩ අරන් විසි කරන
අපි නියම හප නොවෙද

වහල් බැමි වහල්ලක
අයිතියට වැඩ කරන
එදා වේලට වඩා
දෙයක් තව තියෙනවද
අපේ ලඟ නැති වෙන්න...

ඒත් අපි කවදාක දකින්නද
උන් අපට පෙන්නනා
සිහින හැර
හැබෑවෙන ලෝකයක ආලෝක
දෑස් කඩතුරාවක
අන්ධයෝ නොවෙද අප....

■භාග්‍යා

# අලි බබා සහ හොරු 225 පන්නමු..!

වත්මන් මැතිවරණය පවත්වන්න වන්නේ ඉතිහාසයේ දැවැන්තම සමාජ ව්‍යසනයකට පසුබිම නිර්මාණ වී ඇති අවස්ථාවක. මෙම ව්‍යසනයට පාලකලයින්ට කිසිඳු විසඳුමක් නොමැති බව ජනතාවගේ බහුතරය තේරුම් ගනිමින් තිබෙනවා. එක් පැත්තකින් දැවැන්තම ණය කන්දකට රට ඇදදමලා. එය ඩොලර් ට්‍රිලියන 17 ඉක්මවමින් තිබෙන බව වාර්තා වෙනවා. දිනෙන් දින ඇතිවන ආර්ථික කඩා වැටීම අතිශය භයානකයි. ඉදිරි මාස වලදි තවත් මෙය වැඩිවෙනවා මිස අඩුවීමක් නැති බව සියලු ආර්ථික දත්ත මගින් පෙන්වා දි තිබෙනවා. රටේ දරුවන් විශාල ප්‍රතිශතයක්



**..රටේ දරුවන් විශාල ප්‍රතිශතයක් මන්දපෝෂණයට ගොදුරු වෙලා. ජනතාවගේ 1/3 උග්‍ර ආහාර අහේනියක පසුවන අතර 80%ක් එක් කෑම වේලක් හෝ අතහරිමින් සිටින බව ලෝක බැංකු ඇතුළු ජාත්‍යාන්තර සංවිධාන දැනටමත් පෙන්වා දෙයි. ආහාර උද්ධමනය 90% ඉක්මවා තිබෙන අතර විදුලිය, ජලය, දුරකථන ඇතුලු සියලු සේවාවන් වැඩිවන්නේ මිනිසාට දරාගන්නට විනා, හිතා ගන්නටත් බැරි මට්ටමකින්..**

මන්දපෝෂණයට ගොදුරු වෙලා. ජනතාවගේ 1/3 උග්‍ර ආහාර අහේනියක පසුවන අතර 80%ක් එක් කෑම වේලක් හෝ අතහරිමින් සිටින බව ලෝක බැංකු ඇතුළු ජාත්‍යාන්තර සංවිධාන දැනටමත් පෙන්වා දෙයි. ආහාර උද්ධමනය 90% ඉක්මවා තිබෙන අතර විදුලිය, ජලය, දුරකථන ඇතුලු සියලු සේවාවන් වැඩිවන්නේ මිනිසාට දරාගන්නට විනා, හිතා ගන්නටත් බැරි මට්ටමකින්.

මේ අතර අති විශාල බදු කන්දක් ජනතාව මත පටවා ඇති අතර එය ඉදිරියට තව තවත් ඉහළ යාම කිසිවෙකුටත් වැලැක්විය හැක. ශ්‍රී ලංකාව දැනටමත් බංකොළොත් රාජ්‍යයක් බවට ජාත්‍යාන්තරය පිළිගෙන ඇති තත්ත්වයක් තුළ ලංකාවට ආයෝජනයන් ගලා ඒමද අඩුවී තිබේ. මෙම සියලු තත්ත්වයන් හමුවේ වැඩිවශයෙන්ම පීඩාවට පත්වන්නේ දුප්පත් ජනතාවයි. ඔවුන් සිය ජීවන අරගලය ඉදිරියට ගෙන යාම සඳහා දැනටමත් මාරාන්තික සටනක යෙදී සිටින අතර ඉදිරියේදී මෙම පිරිස මරාගෙන මැරෙන සටනකට අවතීර්ණ වීම කිසිවෙකුටවත් නැවැත්විය නොහැකියි. රාජ්‍ය සේවකයන් 80% වැඩි ප්‍රතිශතයක් ඉතා සුළු වැටුපක් ලබන ශ්‍රේණිවලට අයත්වන අතර අදවන විට ඔවුන් නම්බුකාර හිඟන්නන් බවට පත්වී තිබෙනවා. කර්මාන්ත බිඳ වැටීම හමුවේ තරුණ තරුණයන්ට රැකියාවක් සොයා ගැනීමට අතිශයි අමාරු වන අතර, ඔවුන් ආණ්ඩුව සමඟ නොනවතින අරගලයකට පිවිසීම කාලය පිළිබඳ ප්‍රශ්ණයක් පමණයි.

## මැතිවරණයේදී ජනතාව ගතයුතු මඟ

පසුගිය දශක ගණනාව තුළ පාලකයින් කියා සිටියේ ගෝලීය ප්‍රාග්ධනය රට තුලට වඩ වඩා ගලා ඒමට සලස්වන බවයි. එමගින් වැඩි වැඩියෙන් ඉදිකිරීම් කරමින් ආර්ථිකය සංවර්ධනය උත්තේජනය කරන බවයි. මේ ඉදිකිරීම් කොළඹ බස්නාහිර පළාත් කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන බවද පවසා සිටියා. දැවැන්ත මෙගා පොලිස් නාගරික ව්‍යාපෘති, අතර ප්‍රධාන පෙළේ නිවාස යෝජනා ක්‍රම හා අධිවේගි මාර්ග මත කරන ආයෝජන දිගටම පවත්වාගෙන යාමට ක්‍රියා කරන බවට කීවා. මෙහි දෙවන පියවර ලෙස පෙන්වාදුන් කොළඹ ගෝලීය ප්‍රාග්ධණ වෙලඳපොළ මූල්‍ය ලිබරල්කරණය සමඟ වඩ වඩාත් ඒකාබද්ධ කරමින් මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත්කරන බවයි. මේවා ඉටු කිරීම සඳහා විශ්‍රාම වැටුප් හා රක්ෂණ අරමුදල් සහ දේපළ වෙළඳාමට අදාළ වත්කම් කළමණාකරණය ඉක්මන් කිරීම සඳහා දියුණු කිරීමට, මූල්‍යමය උපකරණ පාවිච්චිය කිරීම තුළින් ඉටු කර ගන්නා බවයි. මේ මූල්‍යකරණ ක්‍රියාවලිය තුලින් ගෝලීය ප්‍රාග්ධනය ඒ තුළින් සපයා ගැනීමට සැලසුම් කරන බවද පවසා සිටියා. මේ සැලසුම් සියල්ල කඩවුන පොරොන්දු බවට පත් වී තිබෙනවා.

## ජාවාරම්කාර බලවේගවලට යට වු ග්‍රාමීය සහ නාගරික සංවර්ධනය

පසුගිය දශක කීපය තුළ නගර සභා සහ ප්‍රාදේශීය සභා මඟින් සංවර්ධනයේ නාමයෙන් කරනු ලැබූ බොහෝ ව්‍යාපෘති අසාර්ථක වී තිබෙනවා. මේ ව්‍යාපෘති අතර නාගරික හා ග්‍රාමීය ඇතැම් අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ නියමිත සැලැස්මක් අනුව සිදු වුනේ නෑ. අතුරු මාර්ග කාපට් කිරීම, කොන්ක්‍රීට් දැමීම සඳහා වෙන්කරන ලද මුදල්වලින් සියයට 60 ක් පමණ වැය කර ඉතිරි සියයට 40 කොන්ත්‍රාත් කරුවන් සහ මන්ත්‍රීවරුන් ගසාකෑවා. මේ නිසාම වසර කිහිපයක් යන විට මාර්ග නැවත කැඩී බිඳී යන්නට පටන් ගත්තා. කැලෑ කැපීම, ගංඟාවල්, පතල්, වැලි ගොඩ දැමීම වැනි ජාවාරම් බවට පත්කර ගත්තා. මෙලෙස ස්වභාව ධර්මයේ උරුමයන් වනසමින් කරගෙන පරිසර විනාශය නිසා වාර්ෂිකව ගංවතුර ගැලීම, කඳු නාය යෑම් නිරන්තර ඇති වෙමින් තිබෙනවා. මෙනිසා සෑම වසරකම මිනිසුන්ට ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු වෙනවා. නාගරික සහ ග්‍රාමීය මාර්ගවල කාණු පද්ධතිය පවිත්‍ර නොකිරීම නිසා වැසි දිනවල මාර්ග යට වෙනවා. බොහෝ නගරවල වැසිකිලි පහසුකම් නෑ. මෙලෙස අසාර්ථක වී තිබෙන නාගරික සහ ග්‍රාමීය සංවර්ධනයට වගකිව යුත්තේ කවුද ? නැවත ඡන්දය ඉල්ලා සිටීමට මේ පාලකයින්ට සදාචාරාත්මක අයිතියක් නෑ. මෙවන් සංකීර්ණ සමාජ වටපිටාවක් තුළ ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය පහත සඳහන් වැඩ පිළිවෙල වෙනුවෙන් සටන් වැදීමට තීරණය කරන ලදි.

- ✶ ඇමරිකාව, චීනය, ඉන්දියාවේ ප්‍රමුඛ රටවලින් තබා ගෙන තිබෙනවා ඇතුලු සියලු විදේශ ණය වහා අහෝසි කිරීම.ජාත්‍යාන්තර මූල්‍ය අරමුදල ඇතුලු මූල්‍ය සංවිධානය විසින් අටවන මර උගුලෙන් ගැලවීමට බල කිරීම.
- ✶ රට පුරා මතුවන ජනතා අරගල ඒකාබද්ධ කර ගනිමින් කම්කරුවන්, ගොවීන් ඇතුලු පීඩිත සමාජ බලවේග බලමුළු ගැන්වීමට කටයුතු කිරීම ද එම ජන කොටස් නියෝජනය වන පරිදි ව්‍යවස්ථාදායක සම්පාදන මණ්ඩලයක් ගොඩ නැගීමට බල කිරීම.
- ✶ ස්වයංනිර්න අයිතිය මත පදනම් වි ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබා දීම
- ✶ විධායක ජනපති ධූරය වහා අහෝසි කර රනිල් රාජපක්ෂ පාලනය කපෝති කිරීම..
- ✶ සියලු මර්දන නීති අහෝසි කිරීම
- ✶ ජනාතාවට සංවිධානය වීමට ඇති අයිතිය අදහස් පල කිරීමට ඇති අයිතිය තහවුරු කිරීම.
- ✶ සියලු දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම.
- ✶ වත්මන් රනිල් රාජපක්ෂ පාලනයට එරෙහිව සටන් වදින ජනතාවට සහයෝගය ලබා දීම සඳහා හමුදාවට සහ පොලීසියට ආයාචනය කිරීම සහ හමුදාවේ පහල කොටස් හා පොලීසිවල තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත කමිටු ගොඩ නැගීම.
- ✶ ලාංකීය ජනතා අරගලය පෙරට ගෙන යාම සඳහා දකුණු ආසියානු රටවල ජීවත්වන වැඩ කරන ජනතාවගේ සහයෝගය ලබා ගනිමින් සමාජවාදී කලාපීය බලයක් සඳහා සටන් වැදීම.
- ✶ දකුණු ආසියානු සමාජවාදී සමූහාණ්ඩුවක් සඳහා සටන් වැදීම.

**ශ්‍රී ලංකාවේ සමාජවාදි පක්ෂයේ ප්‍රකාශණයක්**

### කවුළුව..

කෑලි කෑලි වලට කැඩී අහිංසක මතකයන්
බෝඩිමේ ඇද වටේ ඔහේ ඇත වැතිරිලා
සාවුන් පැන ගිහින් තනි වෙච්ච සඳ එළිය
හුදකලාව මකන්නට බෝඩිමට ඇවිල්ලා

වසන්තය වර්ණවත් කළ සුවඳ රැඳි එමල
නෙළාගත් බව හනික වෙනකෙකු කලින්
පැමිණ
කියන සඳ සඳ එළිය මට ඇවිත් කොඳුරන
වසා සැතපෙවී කවුළු පියන්පත නොකියාම

■ සංජය අනුරාධ

### අයාලේ ගිය කතක්....

දෙව්රෙන් වසාගෙන ආදර සිත
දස සිල් රකින මට තහනම් බව
සසරෙන් එතෙර වන්නට ආ මඟ
බැහැ යන්න සිත අඳිනවා පසු පස
මල් පොකුරට සැඟවුන පුංචි සිනාවත
දැළුලයි ආදර දෙවොලේ යටි සිත
පෙම් පුරන තාරකා ඇත අපමණ
ලං වෙන්නෙ බැරිතරම් ඇයිමේ මට
දුටුවන් දෙපා වැලි මලුව දිගේ යන
තහනම් දොඩමලු නෙතග බැලුම්
කර ඇතත් කුසල් මා අද මෙපමණ
සිහිනෙකින් වුවත් නුඹ නෑ මා ලඟ

■ සංජය අනුරාධ

අසනි
සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත
495, මාකොළ උතුර, මාකොළ.
දුරකතන: 077 9053016 / 077 7035167
වෙබ්: https://asanivoice.org

## මහජනතාව දෙගිඩියාවෙන්..!

කප්පරයක් අහස උසට නැගි ජීවන වියදම ගැන වගේ වගක් නැත. කෙළවරක් නැති වැඩ වර්ජන පාලකයිනට දැනෙන වගක් නොමැතිවද, නැතිනම් දෙපිරිසම සාකච්ඡාවෙන්, සම්මුතියෙන් කරුණු කාරණා සිද්ධ කෙරෙනවාද? මේ ආදී වශයෙන් ප්‍රශ්න ජනයා හමුවේ තිබුණත් රටේ බහුතර දේශපාලන පක්‍ෂ ජනාධිපතිවරණයක් /මහමැතිවරණයක් ගැන නන් වැදෑරුම් ප්‍රකාශන කරමින් සිටී.

ව්‍යවස්ථානුකූලව ජනාධිපතිවරණයකට මේ වසර මැදවනවිට කටයුතු සූදානම් විය යුතුය. ඒ අතර, මැතිවරණ කොමිසම වෙනත් අණපනත් ගැන උනන්දුවන බව පෙනේ. ව්‍යවස්ථානුකූල බලතල තිබුණේ වුවද පළාත් පාලන මැතිවරණ 'අහෝසිකම්ම' වන තුරුත් කොමිසම ගත් පියවරක් නැති. හැමතැනකම පාලකයිනට වාසිවන ආකාරයේ කල්මැරීම් එමටය.

ඒ කෙසේ වෙතත්.

.

රනිල් ගැන අබමල් රේණුවක විශ්වාසයක් ජනතාව තුළ නොමැත. පළාත් පාලන මැතිවරණයට ස්වාභාවික මරණයක් අත්කර දුන්නේ ද ඔහුමැයි.. පළාත් සභා මරාදාගන්නට උන් ජාතිවාදීන්ගේ මනදොල සපිරෙන පරිදි එම ඡන්දය ගැන හාං කවිසයකුදු නැත. ඒ වෙනුවට ජාතිවාදී කණ්ඩායම් අනෝරාවක් නා නා  නාමකරණ යොදා ගනිමින් ඊනියා බලවේග ගොඩනගමින් ජනතා දෑස් වලට වැලිගසමින් කාලය කා දමයි. ජනතා වලවේග/ජාතික බලවේග/ජනරජ බලවේග එකී නොකී සිය ගණනක් බලවේග රටේ ධනපති බලවේග සමග අත්වැල් මැදගනිමින් බලයට එන මාවත් එළි පෙහෙළි කරගන්නා කටයුතු වලම නියැලේ. එකකදු වුවත් 'මැතිවරණයක් ' ගැන් කථා අතරේ ජනමත විචාරණයක් හෝ සීමා නිර්ණ කොමිසම යොදා ගනිමින් බලයේ රැදෙන්නට වැඩි ඉඩකඩක් ඇතැයි ජනතා මතය වේ. 'අසනි' හැටියට අප දකින විශේෂත්වය නම් මේ එකදු සංවිධායක/පක්‍ෂයක රටට ගැලපෙන වැඩපිළිවෙලක් සැලැස්මක් ප්‍රකාශ වී නැත. එහෙත් අපි 'ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්‍ෂය' හැටියට අපේ  වැඩ පිළිවෙල එළි දක්වා ඇත. එය මේ පුවත් පතෙහි අන් තැනෙක පළවේ. ඒ ගැන ජනතා අවධනය යොමු වෙතැයි අපි උදෙක්ම විශ්වාස කරමු.

**'අසනි' ඒ වෙනුවේ දැඩිව පෙනිසිටී..!** ■

## ව්‍යාපාර 263,000 ක් කඩා වැටිලා..!

කොවිඩ් 19 වසංගතයෙන් පසු ඇති වු බලපෑම මත ක්ෂුද්‍ර සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාර දෙලක්ෂ හැටතුන් දහසකට ආසන්න ප්‍රමාණයක් වැසී ඇති බව ජන හා සංඛ්‍යාලේඛන  දෙපාර්තමේන්තුව වාර්තා කර තිබුණි.

ඒ අනුව එම ව්‍යාපාරවලින් සියයට 9.9 2019 වර්ෂයේ දී සියයට 33.4 2020 වසරේදීද සියයට 27.4 ක් 2021 වසරේ ද සියයට 29.3 ක් 2022 වසරේද වැසි ගොස් ඇති බව වාර්තා කළේය. 2018 වසරේ දී ක්‍රියාත්මක වු ක්ෂුද්‍ර සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපර වලින් සියයට 20.2 ස්ථිරවම හෝ තාවකාලිකව 2022 වසර වන විට වසා දැමීමට සිදුවි ඇත. සියයට 45.3ක් කොවිඩ් නිසා වසා දැමු බව සඳහන් කර තිබේ. එම සමීක්ෂණ වාර්තාවල තවදුරටත් සඳහන් වන්නේ ස්ථිරව වසා දැමු ව්‍යාපාර සංඛ්‍යාව තාවකාලිකව වසා දැමු ව්‍යාපාරවලට වඩා තුන් ගුණයකින් වැඩි වී ඇති බවයි. ■

## තරුණ පිරිස අතර ඡන්දය නොදෙන ප්‍රවනතාවක්..!

ඉතිහාසයේ අන් කවරදාකටවත් වඩා මේ වන විට තරුණ තරුණියන් අතර පවතින දේශපාලන පක්ෂ සහ නායකයින් පිළිබඳ විශ්වාසය බිඳ වැටිලා ඒ නිසා බොහෝ පිරිස විදේශ රටවල රැකියා සොයා යෑමට කටයුතු කරනවා. ඔවුනට ලංකාව පිළිබඳ කිසිදු විශ්වාසයක් නැහැ. මෙම පිරිසට පවතින ආණ්ඩු පිළිබඳ විශ්වාසය බිඳ වැටිලා. මේ තත්වය තුළ සියලු දේශපාලන පක්ෂ ප්‍රතික්ෂේප කරන තත්ත්වයකට පත්වෙළා. එමෙන්ම පසුගිය අරගලයෙන් මතු වු පාර්ලිමේන්තුවේ 225 ම එපා යන්න මෙම තරුණයන් අතර සාකච්ඡාවට ලක්වෙලා මේ තත්වය තුළ මැතිවරණයේ දී කිසිවෙකුට ඡන්දය නොදී සිටීමට ඔවුන් කටයුතු කරන්න පුළුවන්. ■

## සිස්ටම් චේන්ජ මිරුඟුවක් ද..?

2022 අරගලයෙන් මතු වු ''සිස්ටම් චේන්ජ්'' යන්න මිරිඟුවක්ද යන්න කතිකාවතක් මතුවෙමින් තිබෙනවා. එදා අරගලයට  සම්බන්ධ වු බොහෝ පිරිස් මේ වන විට කලකිරිළා ඔවුන්ට පවතින දේශපාලනය පිළිබඳ විශ්වාසයක් නැහැ. එම අරගලයෙන් මතු වු ඉල්ලීම් පිළිබඳ කිසිවෙකු තුළ සාකච්ඡාවක් නැහැ. අරගලය ඉල්ලා සිටියේ ඔලුගෙඩි මාරුවක් නොව ''සිස්ටම් චේන්ජ්'' එකකි. එය පූර්ණ සමාජ පරිවර්තනයක් නොව පවතින ක්‍රමය වෙනස් කරන්නක්ය. මේ වන විට එවන් තත්වයක් අපේක්ෂා නොකළ හැකි බව දකින්න ලැබෙනවා. ජා.ජබය සහ සජබය බලයයට ආවත් කිසිදු වෙනසක් ඇති නොවන බවයි ඔවුන් සාකච්ඡාට ලක් කරන්නේ. මෙම ගැඹුරු සංකීර්ණත්වය තුළ විප්ලවකාරී සමාජ පරිවර්තනයක් සඳහා සටන් කිරීම හැර වෙනත් මගක් නොමැති බව ඉදිරිපත් කරන මතවාදයට සමාජයේ පදනමක් සාදා ගැනීමට පුළුවන්. ■

3

### ජාජබ ය - සජබ ය භික්ෂුන්..

පාලනය හමුදාකරණය කිරීමත් අනාගත ජා.ජ ආණ්ඩුවකදී 'අදිටන්' නායකත්වයට හා සාමාජිකත්වයට තනතුරු වරදාන දීමට ක්‍රියා කරන්නේ නම් දෙකම එකක් බවට පත් වී තිබෙන්නට පුළුවන්.

ඒත් රාජපක්ෂවරුන් හිටපු හමුදා සාමාජිකයින් වෙනම සංවිධානය කළේ නැහැ. ඔහුන් කළේ තම කැමැත්ත අනුව විශ්‍රාමික හමුදා නිලධාරීන්ට තනතුරුලබා දීමයි. ජා.ජ බය රටපුරා විශ්‍රාමික හමුදා සංවිධාන ජාලයක් සංවිධානය කරමින් තිබෙනවා. මේ සංවිධානවලට එන පිරිස්වල අනාගත ආණ්ඩුවකින් තම අපේක්ෂා ඉටු නොවුණහොත් වෙනම සංවිධාන බවට පත්වීමට ඉඩ තිබෙනවා. එමගින් ලාංකීය සමාජය නැවත හමුදාකරණය වීමේ අනතුරකට ඇදියන්නට පුළුවන්.

අනාගත ආණ්ඩුවකදී රටේ තීරණාත්මක ප්‍රශ්න පිළිබඳ තින්දු කිරීමේදී මෙම පිරිස්වලින් විවිධ බලපෑම් එන්නට පුළුවන් ආරක්ෂක වියදම අඩු කිරීම, හමුදාවල ප්‍රමාණය අඩු කිරීම වැනි පියවරවල සිට ජාතික ප්‍රශ්ණයට දේශපාලන විසඳුමක් ලබාදීම හා හමුදාව අතින් සිදුවුවායැයි කියවෙන මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ විශ්වාසනීය පරීක්ෂාවක් කිරීමටද බලපෑම් ඇතිවිය හැක.

මේ භික්ෂුන් සංවිධානය කිරීම සඳහා සජබයද මේ වන විට බලතරගයකට යොමු වෙලා ප්‍රේමදාස මහතා රටපුරා චෛත්‍ය 1000ක් ඉදිකිරීමට ආරම්භ කරන බව කියා ඇත්තේ ඒ නිසයි. මේ අතර භික්ෂු අනාශාසක මණ්ඩලයක් ද පත්කරන බව කියා සිටියා. ජා.ජ බයද රටපුරා භික්ෂු සංවිධාන ගොඩනැගීමට ආරම්භ කර ඇත්තේ නම් බල තරඟයේ ම කොටසක් ලෙසයි.

පසුගිය දශක ගණනාව තුළම සඟ බලවේග (භික්ෂුන්) පෙනී සිටියේ සිංහල  බෞද්ධ බහුතරයේ මතවාදය නියෝජනය කරන පිරිසක් ලෙසයි. මේ නිසා සමාජය පසුගාමිත්වයකට ඇද දැමීමට ක්‍රියා කළා. 13 වන සංශෝධනය ක්‍රියාත්මක කිරීමද පාසැල් ළමුන්ට ලිංගික අධ්‍යාපනය දීමටද විරුද්ධ වුණා. මෙම භික්ෂුන් දරණ අදහස් නුතන ලෝකයට ගැලපෙන්නේ නැහැ. ජවිපෙ පළාත් සභා පාලනය ජාතික ප්‍රශ්ණයට විසදුමක් ලෙස මේ වන විට පිළිගනු ලැබුවත් එයට මේ භික්ෂුන්ගෙන් බලපෑම් එල්ල වීම අනිවාර්යෙන් සිදු වෙනවා. මේ තුළ සිදු වන්නේ ඉදිරියේ ද පවත්නා පාලනයේ තවත් දිගුවක් ඇදියනබවයි.

මේ සහසබඳතාව  පිළිබඳ ජාතික ජන බලවේගය හා රාජපක්ෂලා අතර ඇත්තේ සමාන කමක් නේද? රනිල් වික්‍රමසිංහටත් වඩා පසුගාමි මතයක් ජාජබය දැරීම මගින් ඔවුන් නියෝජනය කරන්නේ සිංහල බෞද්ධ මතවාදය තවදුරටත් ගෙනයාමට නේද ? භික්ෂූව පන්සලට ධර්මයට ද හමුදාව බැරැක්යටත්යලි සීමා කිරීමෙන් තොරව ලාංකේය සමාජයට ඉදිරි ගමනක් නැහැ. මේ නිසාම ධනේශ්වර සංවර්ධනය ගෙනයාමට හා ධනපති ප්‍රජාතන්ත්‍රවාදි කර්තවයන් එවන් පාලනයකින් සාර්ථක කර ගන්නට නොහැකි වෙනවා. ඔය කියන ''සිස්ටම් චෙන්ජ්'' මිත්‍යාවක් බවට පත් වෙනවා. ■

## ඇදුරු හැවිල්ල

### 'ල' යනු 'ළු' යනු..

චෙගෙන් දුවන මහ බලවේග කොතෙකුත්
ඡන්දය ගැන කියන විට සිහිවේවි නැවතත්
බලවේගයේ 'ල' යනු
'ළු' වී එනොත් කොහොමත්
රටටම අපලයකි ජන හිසට කවදත්

'ද' මහ පැණය ඡන්දය තියෙනමැයි අසයි
'ය' අක්ෂරය අගුණයි නොවේදැයි අසයි
'ප' පිළිතුරකි පිළිතුර අගේමැයි අසයි
'ග' යනු ගනිව ඉලදාන මුන්ටදැයි අසයි

ඇහැලියගොඩ, අඟරුවාමුල්ල, පදිංචි දේව මහින්දදාස වන මා විසින් ඇහැලියගොඩ, මිහිඳු ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි.